**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**
**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී පළමු වසර පරීක්ෂණය - පළමු සෙමෙස්තරය- 2023/24**

**SOC 1101 - සමාජ විද්‍යාවේ මූලිකාංග**

කාලය: පැ <u>දෙකයි (02)</u>.

**ප්‍රශ්න <u>හතරකට</u> (04) පමණක් පිළිතුරු සපයන්න.**

---

1.

i. 'සමාජ ව්‍යුහය' නිර්වචනය කරන්න. (ලකුණු 2)

ii. ව්‍යුහාත්මක න්‍යායයක ප්‍රධාන උපකල්පනය කුමක්ද? උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 3)

iii. විශේෂිත සමාජ සංසිද්ධියක් විශ්ලේෂණය කරන සමාජ විද්‍යාඥයකුට සමාජ ව්‍යුහය වැදගත් සංකල්පයක් වන්නේ කෙසේදැයි උදාහරණයක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 10)

2.

i. පර්යාලෝකයක් යනු කුමක් ද? නිර්වචනය කරන්න. (ලකුණු 2)

ii. කෘත්‍යවාදය සම්මුතිවාදී න්‍යායයක් ලෙස හඳුන්වන්නේ ඇයි? (ලකුණු 3)

iii. ගැටුම්වාදී එළඹුමෙහි ප්‍රධාන ලක්ෂණ දක්වමින් කිසියම් සමාජ සංසිද්ධියක් ගැටුම්වාදියෙක් විශ්ලේෂණය කරන ආකාරය උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

3.

i. විද්‍යාත්මක ක්‍රමවේදයේ පියවර මොනවා ද? (ලකුණු 2)

ii. සසම්භාවී නියදියක් තෝරා ගැනීමේ දී නියදුම් රාමුවක් අවශ්‍ය වන්නේ ඇයි? (ලකුණු 3)

iii. ඔබට HIV ආසාදිතයින් පිළිබඳ ගුණාත්මක අධ්‍යයනයක් කරන්නට අවශ්‍යයැයි උපකල්පනය කරන්න. එහිදී ඔබ නියැදිය තෝරා ගන්නා ආකාරය, දත්ත රැස් කිරීමට තෝරා ගන්නා විධික්‍රම සහ ඔබ විසින් සැලකිල්ලට ගත යුතු ආචාර ධර්මීය කරුණු සාධාරණීකරණය කරමින් කෙටි රචනාවක් ලියන්න. (ලකුණු 10)

4.

i. මැක්ස් වෙබර්ට අනුව විද්‍යාවක අත්‍යවශ්‍ය ලක්ෂණ දෙක මොනවා ද? (ලකුණු 2)

ii. මැක්ස් වෙබර් 'පරමාදර්ශී වර්ගය' පිළිබඳ සංකල්පය හඳුන්වා දුන්නේ ඇයි? හේතු දක්වන්න. (ලකුණු 3)

iii. නිලබලවාදය වඩාත්ම කාර්යක්ෂම සංවිධාන ස්වරූපය ලෙස මැක්ස් වෙබර් හඳුන්වන්නේ ඇයි? ඔබගේ පිළිතුරු විචාරාත්මකව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

5.

i. සංකේතාත්මක අන්තර්ක්‍රියාවාදය දියුණු කිරීමෙහි ලා දායක වූ න්‍යායවේදීන් දෙදෙනෙකු නම් ලියන්න. (ලකුණු 2)

ii. *Asylums* කෘතිය රචනා කළේ කවුරුන් ද? එම කෘතිය කුමන කණ්ඩායමක් පිළිබඳව රචනා වූවක් ද? (ලකුණු 3)

iii. G.H. මීඩ්ට අනුව "මිනිසා අර්ථයන්ගෙන් සමන්විත ලෝකයක් තුළ ජීවත් වෙයි" ("Man lives in a world of meaning"). මෙම ප්‍රකාශය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

6.

i. ආගම පිළිබඳ මෙල්ෆර්ඩ් ස්පිරෝගේ නිර්වචනයෙ හි ප්‍රධාන අදහස් මොනවා ද? (ලකුණු 2)

ii. 'ලෞකිකකරණය' කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 3)

iii. මැක්ස් වෙබර්ට අනුව බටහිර රටවල්වල පෙරදිග රටවලට පෙර ධනවාදය මතු වීම කෙරෙහි ප්‍රොතෙස්තන්ත ආචාරධර්ම බලපෑවේ කෙසේ ද? සාකච්ඡා කරන්න. (ලකුණු 10)

7.

i. සමාජ චලනතාව යනු කුමක් ද? (ලකුණු 2)

ii. ස්ත්‍රී පුරුෂභාවය (sex) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය (gender) අතර මූලික වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 3)

iii. 'පවුල තුළ ප්‍රධාන රැකවරණ සපයන්නා (primary caregiver) ලෙස කාන්තාව වැදගත් භූමිකාවක් ඉටු කරයි. ඇය සිය ප්‍රාථමික වගකීම් සපුරාලීමේ දී සමාජය තුළ ඇයගේ සෙසු භූමිකා ඉටු කරන ආකාරය කෙරෙහි ඉන් සීමාවන් පැනවෙයි.' ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

8. පහත සඳහන් සමාජ විද්‍යාත්මක සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න.

i. පර්යේෂණ සිදු කිරීමේ දී ඇති වන ආචාරධර්මී උභතෝකෝටික (Ethical dilemmas in conducting research) (ලකුණු 5)

ii. සමාජ අන්තර්ක්‍රියාව පිළිබඳ රංගනාත්මක න්‍යාය (Dramaturgical theory) (ලකුණු 5)

iii. සහනුකම්පනය (Empathy) (ලකුණු 5)

******************************